හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

මහනුවර දිස්ත්‍රික්කය.

------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.47,671 ක් රු.26,483 ක් ලෙස ණයහිමියන් යටතේ දැක්වීම හේතුවෙන් ණයහිමියන් රු.21,188 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අයිතිය සභාවට පවරා ගෙන නොතිබූ වටිනාකම හඳුනා නොගත් ඉඩම් කැබලි 37 ක් ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ලිපි ද්‍රව්‍ය මිල දී ගැනීම ගිණුම්ගත කිරීම සඳහා ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය නොකිරීම නිසා, 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.328,357 ක ලිපි ද්‍රව්‍ය තොගය ගිණුම්වලින් අත් හැරී තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්.**

ගිණුම් විෂයයන් 2 කට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.55,182 ක් වූ අතර, ලේඛන අනුව, එම ශේෂයන්ගේ එකතු වටිනාකම රු.807,633 ක් වූයෙන්, රු.752,451 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**1.3.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.
**-----------------------------------**

**(අ)** ලැබිය යුතු ගිණුම්.
**--------------------**

**2016** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම **7** ක එකතු වටිනාකම රු.**5,544,839** ක් වූ අතර, එයින් අවුරුදු **1** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.**2,586,909** ක් වී තිබුණි.

**(ආ)** ගෙවිය යුතු ගිණුම්.
**--------------------**

**2016** දෙසැම්බර් **31** දිනට කර්මාන්ත **16** ක ණයහිමි ශේෂ එකතු වටිනාකම රු.**18,334,972** ක් වූ අතර, එයින් අවුරුදු **1** ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල එකතුව රු.**3,786,191** ක් වී තිබුණි.

**1.3.4** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.
**-------------------------------------------------**

ජල කර්මාන්ත ගබඩා ලේඛනය විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, රු.**342,069** ක් වූ ජල ගබඩා තොග ශේෂය විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**2.** මූල්‍ය සමාලෝචනය.
**----------------------**

**2.1** මූල්‍ය ප්‍රතිඵල.
**----------------**

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, **2016** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.**45,694,091** ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.**40,854,518** ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.**4,839,573** ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2** ආදායම් පරිපාලනය.
**------------------------**

**2.2.1** වරිපනම්.
**----------**

**2016** ජනවාරි **01** දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.**4,620,247** ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.**10,493,588** ක් වී තිබුණි. ඉන් **2016** දෙසැම්බර් **31** දින වන විටත් අය කර තිබුණේ පිළිවෙළින් රු.**2,411,548** ක් හා රු.**7,946,641** ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට **52** ක් හා සියයට **75** ක් විය. **2016** දෙසැම්බර් **31** දිනට රු.**4,755,646** ක හිඟ ශේෂයක් පැවති අතර, ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි. මෙම හිඟ ශේෂයෙන් **2017** මැයි **31** දිනට රු.**3,737,224** ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

**2.2.2** වෙනත් ආදායම්.
-------------------

(අ) සන්නිවේදන කුළුණු ගාස්තු.
-----------------------------

සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුණු **11** ක් සඳහා වසර **3** කට අදාළ රු.**85,800** ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අක්කර බදු.
-------------

**2016** ජනවාරි **01** දිනට හිඟ අක්කර බදු ශේෂය රු.**85,750** ක් වී තිබුණි. මෙම ශේෂය වසර **2** කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවති අතර, ප්‍රාදේශීය සභා පනතේ **158(1)(ආ)** වගන්තිය ප්‍රකාරව හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂය තුළ දී අක්කර බදු බිල් කිරීම් කර නොතිබුණි. එසේම, සභා බල ප්‍රදේශය තුළ විධිමත් සමීක්ෂණයක් කර අක්කර බදු ඒකක හඳුනා ගෙන බදු මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු.
-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් **2016** දෙසැම්බර් **31** දිනට උසාවි දඩ රු.**1,093,460** ක් හා මුද්දර ගාස්තු රු.**35,003,006** ක් අය විය යුතුව තිබුණි. මෙම හිඟයෙන් **2017** ජුනි **2** දින වන විට උසාවි දඩ රු.**190,000** ක මුදලක් සහ මුද්දර ගාස්තු රු.**30,395,026** ක මුදලක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය.
---------------------------

**3.1** කාර්යසාධනය.
-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) පොදු වැසිකිළි ඉඩ පහසුකම් සැපයීම ප්‍රාදේශීය සභාවේ කාර්යය භාරය වුවත්, මැදවල හා අලදෙණිය යන නගර සඳහා පොදු වැසිකිළි පහසුකම් ලබා දීම කෙරෙහි සභාව අවධානය යොමු කර නොතිබුණි.

(ආ) සභාව විසින් ජල සැපයුම් ලබා දෙනු ලබන මහතැන්න ජල යෝජනා ක්‍රමයේ ජලය පෙරහන් කිරීමක් හා පිරිපහදුවක් සිදු නොකර ජලය ලබා ගන්නා ළිඳට ක්ලෝරින් යෙදීම පමණක් සිදු කර සෞඛ්‍ය ආරක්ෂිත නොවන පරිදි පුද්ගලයින් **73** දෙනෙකු වෙත ජලය බෙදා හැර තිබුණි.

(ඇ) සභාවක පුනරාවර්තන ආදායමෙන් අවම වශයෙන් සියයට 30 ක ප්‍රතිපාදන සංවර්ධන කටයුතු සඳහා යෙදවිය යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ පුනරාවර්තන ආදායම වූ රු.63,280,099 කින් රු.4,320,300 ක් හෙවත්, සියයට 7 ක් පමණක් සංවර්ධන කටයුතු සඳහා යොදවා තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව, තථ්‍ය සේවක සංඛ්‍යාව සමග සැසඳීමේ දී පුරප්පාඩු 7 ක් හා අතිරික්ත 9 ක් පැවතුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නළ ළිං ලේඛනයට අනුව සභාව සතු නළ ළිං 311 ක් පවතින බව දක්වා ඇතත්, ඒ පිළිබඳව විධිමත් සමීක්ෂණයක් සිදු කර හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මාසිකව රු.500 ක ගාස්තුවක් අය කිරීම මත සභාවට අයත් නළ ළිං භාවිතා කිරීමට ප්‍රදේශවාසීන්ට අවස්ථාව ලබා දී තිබුණි. ඒ අනුව, 2016 වර්ෂය තුළ නළ ළිං 311 සඳහා අවම වශයෙන් රු.155,500 ක ආදායමක් සභාවට අය විය යුතු වුවත්, වර්ෂය තුළ රු.2,000 ක් පමණක් අය කර තිබුණි.

(ඇ) 2012 සිට 2015 දක්වා කාලය තුළ ගොඩනැගිලි සැලසුම් අයදුම්පත්‍ර 1134 ක් අනුමත කර ඇතත්, ඉන් අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ 153 ක් සඳහා පමණි.

(ඈ) හැදෙණිය නගරයේ දැනට පවත්වා ගෙන යන පොදු වැසිකිළිය භාවිතයට ගත නොහැකිව අබලන්ව, අපවිත්‍ර වී භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණත්, මෙම පොදු වැසිකිළිය සඳහා ජල පහසුකම් ලබා ගැනීමට 2016 ඔක්තෝබර් 19 දින රු.24,028 ක් ගෙවා තිබුණි. එහෙත්, 2017 ජනවාරි 18 දින වන විටත් ජල සම්බන්ධතාවය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මැදවල පිහිටි හෙක්ටයාර් 0.5239 ක් පමණ වූ ක්‍රීඩා භූමිය 2014 ජුලි 15 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් සභාව වෙත පවරා දී ඇතත්, 2017 ජනවාරි 18 දින වන විටත් එහි කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කර නොතිබුණි.

(ඊ) සභාව සතු කුරුඳුගහමඩ ගබඩාව 2017 ජනවාරි 18 දින භෞතිකව පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ගබඩාවේ වෙන්දේසිය සඳහා නිර්දේශ කර තිබූ ද්‍රව්‍ය ගබඩා කොට තිබූ අතර, ඒවා පහසුවෙන් හඳුනා ගත හැකි පරිදි විධිමත් ලෙස ගබඩා කර නොතිබුණි.

(ii) සභාව විසින් වසර 3 කට වඩා වැඩි කාලයක දී මිලදී ගෙන තිබූ වටිනාකම හඳුනා ගත නොහැකි යකඩ පුටු 215 ක් කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව ගබඩාව තුළ ගොඩ ගසා මළ බැදී දිරා පත් වීමට ඉඩ හැර තිබුණි.

(iii) මෙම ගොඩනැගිල්ලේ කොටසක බාහිර පාර්ශවයන් විසින් සිඟිති පෙර පාසලක් 1998 වර්ෂයේ සිට පවත්වා ගෙන යමින් පැවතියත්, ගාස්තු අය කිරීමක් හෝ කිසිදු ගිවිසුම්ගත වීමක් සිදුව නොතිබුණි.

3.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්.
---------------------------------------
රු.8,700,000 ක් වටිනා වාහන 2 ක්, වටිනාකම හඳුනා ගත නොහැකි වාහන හා යන්ත්‍රෝපකරණ අයිතම 18 ක් නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතිණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය.
---------------------------
2016 වර්ෂය සඳහා සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන යෝජනා වර්ෂය ආරම්භයේ දී අනුමත කර ගෙන ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබියදී, සංවර්ධන යෝජනා 22 ක් අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා වෙත වර්ෂයේ මැද භාගයේ අවස්ථා 3 කදී ඉදිරිපත් කර සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට යෝජනා 10 කට පමණක් අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කිරීමෙන් බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු අපේක්ෂිත ප්‍රමාණයෙන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.
-------------------------------------
4.1 අයවැය පාලනය.
------------------
සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයයන් 3 ක සියයට 25 සිට සියයට 67 දක්වා සහ වියදම් විෂයයන් 5 ක සියයට 25 සිට සියයට 60 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය

වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ රු.42,195,550 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 සංයුක්ත සැළැස්ම.**

--------------------

සමාලෝචිත වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය.**

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ණයගැතියන් හා ණයහිමියෝ